ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව
දිනය | 2014/02/28

## 2014 පෙබරවාරි මාසයේ දී උද්ධමනය තවදුරටත් පහළට

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ (කො.පා.මි.ද.) (2006/2007=100) ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන උද්ධමනය, 2014 ජනවාරි මස පැවති සියයට 4.4 හි සිට 2014 පෙබරවාරි මාසයේ දී සියයට 4.2 දක්වා තවදුරටත් පහළ ගියේය. මෙය 2013 ඔක්තෝබර් මාසයේ පැවති සියයට 6.7 හි සිට උද්ධමනය අඛණ්ඩව පහළ වැටුණු සිව්වැනි අනුයාත මාසය වේ. 2013 ජූනි මාසයේ සිට අඩු වන නැඹුරුවක් ගත් වාර්ෂික සාමාන්‍ය උද්ධමනය ද 2014 ජනවාරි මාසයේ පැවති සියයට 6.5 හි සිට 2014 පෙබරවාරි මාසයේ දී සියයට 6.0 දක්වා අඩු විය.



මිල දර්ශකයෙහි අගය පූර්ව මාසයට සාපේක්ෂව අඩු වශයෙන් ඉහළ යාම සහ පදනම් බලපෑම 2014 පෙබරවාරි මාසයේ දී උද්ධමනය පහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. ආහාර කාණ්ඩයේ රතු ළූණු, ලොකු ළූණු, අර්තාපල්, බිත්තර සහ බොහෝ එළවළු වර්ගවල මිල ගණන්හි පහළ යාමක් වාර්තා විය. කෙසේ වුවද, සහල්, පොල්, කුකුළු මස්, කිරි පිටි, සමහර මත්ස්‍ය වර්ග සහ පළතුරු මිල ගණන්වල ඉහළ යාමක් වාර්තා විය.

ආහාර නොවන කාණ්ඩයේ නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන උප කාණ්ඩයෙහි මිල ගණන්හි පහළ යාමක් 2014 පෙබරවාරි මාසයේ දී වාර්තා විය. මේ අතර, සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික; සහ අධ්‍යාපන යන උප කාණ්ඩයන්හි මිල ගණන් මාසය තුළ නොවෙනස්ව පැවතිණි. කෙසේ වුවද, ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තුව (සියයට 0.8 කින්); විවිධ භාණ්ඩ හා සේවා (සියයට 0.6 කින්); රෙදිපිළි හා පාවහන් (සියයට 0.1 කින්); සෞඛ්‍ය (සියයට 0.1 කින්); සහ ප්‍රවාහන (සියයට 0.1 කින්) යන උප කාණ්ඩයන්හි මිල ගණන්වල ඉහළ යාමක් වාර්තා විය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන්හි සඵලතාව පිළිබිඹු කරමින් මූලික උද්ධමනය එහි පහළ යාමේ නැඹුරුව අඛණ්ඩව පවත්වා ගනු ලැබීය. ඒ අනුව, වාර්ෂික සාමාන්‍ය සහ ලක්ෂ්‍යමය යන දෙයාකාරයෙහිම පදනම මත මූලික උද්ධමනය පිළිවෙලින් 2014 ජනවාරි මස පැවති සියයට 4.1 සහ සියයට 3.5 හි සිට 2014 පෙබරවාරි මාසයේ දී පිළිවෙලින් සියයට 3.8 සහ සියයට 3.1 දක්වා පහළ වැටිණි.